# සඳට පෙම් බැඳි සිත්

ආචාර්ය කාන්ති ජයසිංහ

ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය

රුහුණ විශ්වවිද්‍යාලය.

# සඳට පෙම් බැඳි සිත්

© කාන්ති ජයසිංහ

ISBN 978-624-5553-07-5

ප්‍රකාශනය : සංස්කෘතික කේන්ද්‍රය

රුහුණ විශ්වවිද්‍යාලය

ප්‍රථම මුද්‍රණය : 2021

පිටු සැකසුම : එන්. එච්. ටී. අනුරුද්ධ

කවරය සැකසුම : සංජු උෂාන් රන්ගොඩගේ

**මේ පොත**

**පුදමි බැතියෙන්...**

රිදුණු රිදවපු තැන්
සුවපත් කරන්නට
උකුල් තොටිල්ලේ තියා
මා නැලවූ
මගේ ආදරණීය අම්මාට,
සොබා දහමට ජීවයක් දී,
පරිසරය විඳින්නට
කතාවක් ගොතා කියා
මුව අයා සිනාසුන
රත්තරං තාත්තාට.

## ඉතින් අහන්නකො...

සැප සම්පත් ගොඩක් දීල මාව හදා වඩන්නට මගේ අම්ම තාත්තට වත්කමක් නොතිබුණාට ඒ දෙන්න මට ගොඩාක් ආදරය දුන්නා. ඇත්තටම මහ ගොඩාක්.....

ගස්කොළන්වලින් වටවුණ නිහඬ පරිසරයක හැදුන මගේ සිතේ හැම වෙලාවෙම ඒ ගහකොළවලට, සතා සිව්පාවාට, පක්ෂීන්ට පුදුමාකාර ලෙන්ගතුකමක් තිබුනේ. ඒ සුන්දර පරිසරය වින්ද නිසාම වෙන්න ඇති ඇතැම් සංවේදී සිද්ධිවලදි මටත් නොදැනීම මගේ සිත කවියක්, නිසදැසක් ලියන්න මාව පොළඹවන්නේ. උත්පත්තියෙන් ආපු කිසියම් හැකියාවකට යාන්තමට පිණී පොදක් ඉහුනට කවිකම වැඩිපුර අතපත ගාපු කෙනෙක් නෙවෙයි මම. කොහොම වුනත් හිතට එන සිතිවිල්ලක් යාන්තමට කටුගාලා නවකයින්ට ඉදිරියට එන්න මුහුණු පොතේ තිබුණු ඉඩකඩ නොවෙන්න, මට මෙවැනි තැනකට එන්න තිබුණු දුර තවමත් දුර වෙන්න තිබුණා.

**තව දෙයක් තියෙනව නොකියාම බැරි,**

මේ පොත් පිංචේ තියෙන හැම නිර්මාණයක් ම කවියක් නොවෙයි. නිසදැස්, කවි. ගීත වැනි හැම දෙයක්ම මේ තුළ අන්තර්ගතවෙලා තියෙනවා, මගේ අතින් නිර්මාණය වුනු පළමුවෙනි නිසඳැස තමයි කැඩපතක සේයා.
ඒකෙ ගොඩක් අඩුපාඩු තියෙන්න ඇති. නමුත් ලස්සනයි කියල අගේ කරල තව තව ලියන්න කියල මාව දිරිමත් කළේ, කවි පොතක් කරන්න පෙළඹුවේ මුහුණු පොතේ මගේ රසිකයෝ. ඔවුන් සියලුදෙනාටම මාගේ ගෞරවණීය ස්තුතිය.

මට ලියන්න හේතු දුන්න, නිදහස දුන්න, අත දුන්න, මාගේ නිර්මාණ රසවින්ද දයාබර ජයන්ත, දුව ගිත්මි, පුතා රිසින හිතට නුදුරුයි හැමදාම.

පොත් පිංච ලස්සනට ඉක්මණට කැපවීමෙන් පිටු සකස්කර දුන් තරංග අනුරුද්ධ පුතණුවන්ට ස්තුතියි.

පිට කවරය හැඩ කළ සංජු උෂාන් රන්ගොඩගේ පුතණුවන්ට ස්තුතියි නොමදවම.

ස්තුතියි වචනයකින් හෝ මා දිරිගැන්වූ සැමට.

යමක් දකින්න, විඳින්න, ලියන්න මට නිමිති සැපයූ සොබා දහමට ණය ගැතියි හැමදාමත්.

ආචාර්ය කාන්ති ජයසිංහ
ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය
රුහුණ විශ්වවිද්‍යාලය.

# පටුන


| | |
|---|---|
| 01. ඔන්ලයින් වාසිටි | 1 |
| 02. ඇවැස්ස මස්සිනේ මගෙ හද නුඹ ගාව | 3 |
| 03. මිළ මුදලට යට නොවෙන කොරෝනා | 5 |
| 04. නුඹ එක්ක මැව් හීන | 6 |
| 05. ඉවුරේ නම ලියමු | 7 |
| 06. මම ඔබට ආදරේ තරම් | 8 |
| 07. ගයමු පෙම් ගීතේ | 9 |
| 08. සපත්නීරෝෂය | 10 |
| 09. සොඳුරුම සිත්තම නුඹය පියාණනී | 12 |
| 10. හුස්ම පොද මගෙ හිරවෙලා | 13 |
| 11. ඇය | 15 |
| 12. නොලද දරු සෙනෙහස | 16 |
| 13. ඔබයි තැනුවේ මගේ දිවියම | 17 |
| 14. මහ වැස්සට මම බයයි | 18 |
| 15. හැඩ වුනාට විජ්ජු ලතා | 19 |
| 16. පිටුපෑ සෙනෙහස | 20 |
| 17. කුළුඳුල් ප්‍රේමය | 22 |
| 18. පුතුගෙ උරුමය | 23 |
| 19. පිටමන් වෙන්න කොරෝනා | 24 |

| | |
|---|---|
| 20. කෙවිලියේ | 25 |
| 21. බොඳවූ සිහින | 26 |
| 22. නැවතුමක් නැති ගෙත්තමක් | 27 |
| 23. බලන් කඩතුරා හැර දෑසේ | 29 |
| 24. නංගියේ මං අසරණයි | 30 |
| 25. ආයි ආයි ආපි ඔන්න පාසල් කාලේ.... | 31 |
| 26. පාට කළ හීනයක් | 33 |
| 27 අණ්ඩපාලී | 34 |
| 28.පොඩි කෙලී | 36 |
| 29. බෙදුනු සෙනෙහස | 38 |
| 30. නුග ගසත් හැඬුවා | 39 |
| 31. සීතලෙන් ගුලිවෙලා | 40 |
| 32. කැඩපතක සේයා | 42 |
| 33. නිල්වලා රන් දිය | 44 |
| 34. පියාණනි සදාදර | 45 |
| 35. අසේවනාච බාලානං | 46 |
| 36. එහෙන් මෙහෙන් ගෘහනියන්ගෙ Online කතා | 48 |

37. මට රිදෙන්නේ නෑ 50

38. ඔබමම පමණය 52

39. උල ලේනෝ නුඹ නාඬන් 53

40. තාත්තා සහ ස්ථාවර තැන්පතුව 55

41. හිතන්න, නවතින්න, ඉසිඹු ලන්න 57

42. සඳට පෙම් බැඳි සිත් 59

43. කණාමැදිරි එළි 61

44. දෙමව්පියෝ 62

45.මොටෝ රිය සහ අපි 63

46. රොබරෝසියා 65

47. තුරු රජිඳා 66

48. පුත නුඹ වැරදි නැත 48

49. පුතේ නුඹයි තනි අලියා අපේ සනුහරේ 70

50. ගුරු දෙවියෝ 73

## 01. Online වාසිටි

යනවලු හෙට සරසවියට මගේ මුණුපුරා
දරාගන්න බෑ මට නම් සතුට උතුරලා
අම්ම තාත්තා හිටියට
නැන්දල මාමල හිටියට
ඌ හැදුනේ මගේ අතේ
සුරතල් පාලා......

ඒත් ඉතින් බලහල්ලකො
මුගේ තියෙන උඩගුකමට
ආවේ නැහැ නිකමටවත්
බලල යන්න අපි දෙන්නව...

ට්‍රන්ක පෙට්ටියත් සේදුව
අඩුම කුඩුම දමන් යන්න
කැටේ හලල කාසි ටිකත්
අරන් තිබ්බ ඌට දෙන්න

මටත් හිතයි ගිහින් එන්න
කොලුව එක්ක වාසිටියට
අපූරුවට තියෙනවා ලු
මහ විශාල ලෝකයක් ලු

අත්තම්මේ හෙට උදේම
කාල බීල රෙඩි වෙන්නකො
කොල්ල එවල පණිවිඩයක්
ඉවසුම් නෑ එළිවෙන තුරු

ලින්ක් එකක් එවනවා ලු
ටවුමට යන්නට වෙන්නැති
ජැන්ඩි පහට ඇඳල කියල
කොල්ල ඒවි පාන්දරම

කොල්ල එනව හතිදාගෙන
සිග්නල් නෑ අත්තම්මේ
නගිමු ද මේ වහල උඩට
ලොග් වෙන්නට පුළුවන් වෙයි
එතකොට මට සරසවියට
මගේ සිහින සරසවියට
ඒ ලස්සන සරසවියට
කොල්ල කියපි එකපාරට
කොහෙන් ද උත්තර මේවට
අනේ මගේ කොලු පැටියෝ
නොකා නොබී නිදිවරලා
නුඹ තනාපු සිහින ලොව ද
යන්නේ මේ බොඳවීලා

******************************

## 02. ඇවැස්ස මස්සිනේ මගෙ හද නුඹ ගාව

චාරිත්තරේ හැටියට
ඇවැස්ස විවාහෙට පිටුපෑවට
පව් නෑ කියල
බුලත් කොළ සීයක් ම දීල
ඇවැස්ස මස්සිනාට
වැඳපන් මයෙ පුතේ....

අප්පච්චිගේ අණ
කඩ කෙරුවොත් විණ
ඒ නිසාවෙන්
වඳිනවා මම නුඹට
මගේ සුදු අය්යණ්ඩි

සියලු පව් අහවරයි
අප්පච්චි සිතුවාට
හුස්මක වෙනස පවා
දැනෙන තරමට ලංවෙලා සිටි
නුඹට කරන මේ වරදට
සමාව ඉල්ලන්න
හිත වාරු නෑ අය්යණ්ඩි....

නුඹේ ලෙන්ගතුකම
හදවතේ රඳව ගෙන
පෝරුවෙන් මම බැස්සෙ
නුඹ සමග අය්යණ්ඩි

ඉතින් මට අවසරයි
ඇවැස්ස අයියණ්ඩියේ
සිත තියා නුඹේ ළඟ
ගතින් යුග දිවි යන්න

සුමිත්‍රා රාහුබද්ධ නම් වූ ප්‍රවීන ලේඛිකාවගේ සිය සිය පත් සිය කෘතිය කියවන විට ඇති වූ සිතිවිල්ලකි. කාන්තාවන් බොහොමයක් තම පවුලේ ගෞරවය ආරක්ෂා කර ගැනීම සඳහා හදවතින් විඳින දුක් කන්දරාව මෙම කෘතියෙහි අපූරුවට විග්‍රහ කොට ඇත.

මාගේ මෙම නිර්මාණය එතුමියට උපහාරයක් ම වේවා

******************************

## 03. මිළ මුදලට යට නොවෙන කොරෝනා

උත්සව කාලෙ සුන්දර ලෝකය මවලා
තොරොම් බෝල කඩ ටික හැඩ වැඩ දාලා
කන්දෙක බිහිරි වෙන තරමට හඬ තලලා
කෑවා නේද අවුරුදු ජයට ම නුඹලා

යන්නට එපා එළියට දැන් කියන්නේ
කවුරු ද ඉතින් රවටන්නට හදන්නේ
වරදක් කිසිම නැති ලෙස රඟමින් ඉන්නේ
මිනිසුනි තවත් උන් පසු පස ම ද යන්නේ

ගැහෙනා පපුව පණ ඉල්ලා හඬන විට
කිසිවෙක් එන්නෙ නැත දුක සැප බලන්නට
පෙනි පෙනි වරද නිවරද කර නොගත් කොට
ආඳා යවා දැන් වළපත ගෙන කුමට

අනුනට දෙස් දෙවොල් කීමෙන් පලක් නැත
අපෙ පණ කෙන්ද අප අතෙහි ම රැඳී ඇත
නිවැරදි හොඳ පුරුදු කිසි නොදමා ඉවත
යහපත් දිවියකට හැමට ම දෙන්න අත

තිබුණත් මිළ මුදල් යහමින් අත රැඳිලා
අභියස කොරෝනා ඒවයෙ බල බිඳිලා
මේ ගැන සිතා සිහි නුවණින් විමසාලා
අපි වැඩ කරමු අපෙ ජීවිත ගැන හිතලා

******************************

## 04. නුඹ එක්ක මැව් හීන

සරසවියෙ හැම තැනම නුඹෙ මතක මැවෙනවා
නුඹ එක්ක මැව් හීන මම තවම විඳිනවා
හන්තානෙ හඳපාන හදට කිති කවනවා
නුඹ එක්ක මගෙ හීනෙ මම තවම ඉන්නවා

මහවැලිය ගලනවා මගෙ හීන වැල අරන්
මගෙ දෑසෙ කඳුලු වැල් ඒ තුළට එක්කරන්
අක්බාර් පාලමේ එහා ඉම පසුකරන්
නුඹ ගියා නොකියාම ඇගේ අතිනත අරන්

දෙසුම් හල  අවන්හල  පොත් ගුලේ හැම තැනම
ළඟ අසුනෙ නුඹෙ සුවඳ කරමි අමතක කොහොම
තනිකමට වරම් නැති ගහක් යට බැහැ රැඳුම
ඔටු ගහේ  සෙවණෙ  මම ඉඳින්නම් පෙර සේම

******************************

## 05.ඉවුරේ නම ලියමු

ඉවුරකට කොහෙද ඉඩ
එහා ඉම සිපගන්න
හැමදාම සැනසෙන්නෙ
මෙහා ඉම ඉඳන් මම

එහා ඉම සිප නැගෙන
ජල තරඟ මෙහා ඉම
හැමදාම සිපගන්නෙ
දෑළ සුවඳත් සමග

දෑළ යාවෙන තරමෙ
පාලමක් තනන්නට
අවසරක් කොහි වේ ද
ඉවුර තව දුරයි මට

හීන මාළිගය මම තනනවා හැමදාම
එහා ඉම අවසරය පතනවා හිත තාම
ජල පහර වේගයෙන් බිඳ ගියත් හැමදාම
දෑළ ඉවුරේ නැවත ලියමු අපි අපේ නම

*****************************

## 06. මම ඔබට ආදරේ තරම්

ඔබ සමගින් සිත දොඩමළු තරමට
මුව දොඩමළු වූවා නම්
දස දහස් වාරයක් පවසනවා
මම ඔබට ආදරේ තරම්

සිත ළංවන තරමට ඔබ සමගින්
ගතින් ලංව ඉන්නට හැකි නම්
මුමුනන්නට තිබුණා කණට කොඳුරලා
මම ඔබට ආදරේ තරම්

සීමා මායිම් බාධක වැට කොටු
මුරකාවල් තිබුණත් කොතරම්
සිත සැමට හොරා ඔබ ළඟ සරනා සේ
මට එන්නට හැකිනම් ඔබව සොයා
ගොඩනගන්න තිබුණා  අපේම ලෝකය
අපි දෙන්නා පතනා අයුරින්

*****************************

## 07. ගයමු පෙම් ගීතේ

වසන්තය ඇවිදින්

නව අවුරුද්දත් සමගින්

සිත ගත් මගේ කෙවිලියේ

අපි ගයමු පෙම් ගීතේ.....

එල බරයි තුරු වදුළේ

ජල තරඟ නගයි නදියේ

ඇළට දොළට ගහ වැලට මලට

අපි ගයමු පෙම් ගීතේ.......

නිල්ල දිළෙන මේ පින් බිමේ

විපත් රෝහිය දුරුවී

සිත් පහන් වී යළි රඟන්නට

අපි ගයමු පෙම් ගීතෙ

******************************

## 08. සපත්නීරෝෂය

පස්වාන් දහසකට අවසර

මහ රජාණෙනි මෙපුර බැබළෙන

අග බිසව අසනීපයෙන්

බලාගත් අත විපරමෙන්

අන්තඃපුර කතුන් දෙසමයි

ඔරවමින් බැලුවේ......

වැරදි බොජුනක් වැළඳුවෙත් නෑ

දූවිල්ල කුණු තැවරුනෙත් නෑ

ඇසට ගැටුනා නරක දසුනක්

ඒකදෝ මන්දා.......

ඉරුණු වැරහැලි ගත දවට ගෙන

ගැහැණියක් නම් ගියා මාවත

ඇගේ සැමියගෙ අතේ එල්ලී

මොනවදෝ කියමින් තොදොල් වී....

මේ තරම් සම්පත් ලබා දී

සියලු දේට ම දැසි දසුන් දී

බලාගත් මගෙ අගබිසෝ

සුව කරන්නට කුමක්දෝ මට

කරන්නට හැකි වෙදැදුරාණෙනි.....

රජතුමණි. ඔය ලෙඩේ නම්

සුව පහසු නෑ

අගබිසව් හට වැළඳිලා ඇත

සපත්නීරෝෂේ......

අගබිසව් තනතුර ඉවත්කර

ලබා දුන්නොත් බිසව් තනතුර

කිසිදු බෙහෙතක් අවැසි නෑ  වෙන

සුව වෙනව ඇය සත්තමයි

*****************************

## 09. සොඳුරුම සිත්තම නුඹය පියාණනී

නුඹෙ ලේ බිඳකින් මා බිහිවෙන තෙක්
පෙරුම් පුරා නුඹ ඉන්න ඇතී
නුඹෙ දියණිය වී මා බිහිවූ දින
නුඹ රජෙකැයි නුඹ සිතන්නැතී

ටිකිරි සිනා පා මා හිනහෙන විට
නුඹෙ මුව මල් පිබිදෙන්න ඇතී
නුඹේ ලෝකයේ මට හිමි වූ තැන
පවසන්ට මට වදන් නැතී,

නුඹෙ සෙනෙහස් ලොව
කිරුළ දරන්නට
මා කළ පින නම් නිමක් නැතී
නුඹෙ දිවි රැකුමට මගෙ දිවියම වුව
පියාණනේ කැප කරනු හැකී

මගේ ලෝකයේ සක්විති රජු නුඹ
මගේ ලෝකයේ හිරු සඳු වේ නුඹ
මා ළය මඩලේ සොඳුරුම සිත්තම
නුඹමය පියාණනී........

****************************

## 10. හුස්ම පොද මගෙ හිරවෙලා

මට නොතේරෙන සහේතුක දුක්
කඳක් හිත තුල තෙරපිලා
පපුව දනවා හිසත් කැරකේ
හුස්ම පොද මගෙ හිරවෙලා

පැටව් ටික අපෙ තුරුළු කරගෙන
නිදා සිටියත් තනිවෙලා
නින්ද නෑ මට තුරුළු වෙන්නේ
හඬන හද කඳුලක් වෙලා

එකින් එක එන රූ රටා නෙක
ගින්න වාගෙයි ඇවිලෙනා
නුරා දැහැනින් ඈ වෙලාගෙන
සිටින නුඹ මට මැවෙනවා

අනේ රන් කඳ කව ද හිඳිමු ද

කූඩුවක එක ගුලිවෙලා

අපට අපගේ පමණක්ම වූ

ලෝකයක් නැතිදෝ මවා

එවැනි දවසක් එනතුරා මා

ඉවසුවත් කල් බල බලා

මගේ හදවත මැරී වැටිලා

බොහෝ කල් දැන් ගතවෙලා.

******************************

## 11. ඇය

රඟන ජීවන වේදිකාවේ

දියණියයි ලොව කලඑළිය කළ

සොයුරියයි දිවි අත්වැලක් වුන

සොඳුරියයි සෙනෙහසින් පුදදෙන

මව්තුමිය උණු කිරෙන් සනසන

මිත්තනිය ලොව අරුත පසදන

විශ්වයට සිසිලස  බෙදා දෙන

සඳුන් හර ඇය ලොව සුවඳ කළ

අරුත්බර  අරුණක්ම මවමින

**ළඳයි** ඇය නෙක අරුත් ගෙන එන

******************************

## 12. නොලද දරු සෙනෙහස

මවක් වන්නට

පියෙක් වන්නට

සසර අප පිං මදැයි දැනිල ද

නොපිපි කුසුමක් වුනේ

කුසට හොත් බිළිඳුනේ....

හදවිමන් දොර දයා දිය බිඳු

අදත් එලෙසම නොසිඳිලා ඇත

කියන් තව පින් කොතෙක් අවැසි ද

නුඹ නමින් මව්පියන් වන්නට

සසර සරණා බිළිඳුනේ .....

සුජාතා සිටු දියණී සේ

අනේපිඬු සිටු තුමා සේ

නුඹ නමින් තව දන් පුදන්නෙමු

පෙරුම් පුරමින් බලා ඉන්නෙමු

රුහිරු කිරි කඳුලක් පොවන්නට

බිළිඳුනේ අප බිළිඳුනේ .....

*****************************

## 13. ඔබයි තැනුවේ මගේ දිවියම

නුඹයි ලිව්වේ පෙරවදන මට

මගේ ජීවන පොතේ

නුඹයි ලිව්වේ පසුවදන මට

මගේ ජීවන පොතේ ......

අග මුල ගලපා

මුල මැද ගලපා

හොඳට බලලා

කපල කොටලා

වැරදි  පෙන්වා

හොඳත් අගයා

මුළු පොතම හැඩ කළා....

ඉරයි ඔබ මට

සඳයි ඔබ මට

මගේ ලෝකය කලඑළිය කළ

සසර සැමදා මගෙම වේවා

මගේ බුදු අම්මා...

******************************

## 14. මහ වැස්සට මම බයයි

පැහැදිලි නිල්පාට ආකාසෙ

වැහි වළාකුළු හැදෙනවට

මම හරි බයයි

මහ වැස්ස වහිනවට

මම හරි බයයි

ඒ වැස්සට නුඹ තෙමේවි ද

මට හරි බයයි

මුවා වේවි ද පාට කුඩයකට

මට හරි බයයි

අනෝරා වැස්සකට වුව

නුඹව නොතෙමෙන්න

මම හදපු කුඩුවේ

මට නුඹව රැකගන්න

නොහැකි වේදෝ කියා

මට හරි බයයි

*****************************

## 15. හැඩ වුනාට විජ්ජු ලතා

උකුළු මුකුළු සිනා පපා

වෙහෙස මහන්සිය විමසා

හිමිට හොරෙන් අන් හිමි හට

බැල්ම හෙලන නගේ

හැඩ වුනාට විජ්ජු ලතා

හෙණ හඬ පුපුරණ වෙලාව

ආසන්නෙම තිබෙනා බව

නොසිතුවෙ ඇයි නගේ

විසිරෙන පොඩි කැදලි දෙකක

සුන්බුන් එක් කළ හැකි වෙද

නාරිලතා ඇලුම් බැලුම්

නවතාපන් නගේ

නාරි ලතා මල් සුවඳට

ඇලුම් කරන වන බමරුන්

සුවඳට නොව රොනට ඇදෙන

බව සිතපන් නගේ

******************************

## 16. පිටුපෑ සෙනෙහස

හමුවෙන්න හැකිවේද එකම එක වතාවක්

දැනගන්න ආසයි මට කාරණාවක්

මම පිදුව සෙනෙහසට පිටුපා ගියේ ඔබ

කිව හැකි ද ඇයිදෝ කියා...

හමුවෙන්න හැකිවේද එකම එක වතාවක්

පවසන්න අවැසියි මට කාරණාවක්

ඔබ පිදුව සෙනෙහසට පිටුපෑ දිනේ සිට

හදවත මගේ දැවෙනවා...

තුන් සිතම පහදා මම පෙම් කළා

තුන් සිතම රවටා ඔබ පෙම් කළා

ඔබ ළඟම දැවෙන සිත

දොඩමලුයි ඔබ සමග

මුව වදන් ඇත ගොලු වෙලා...

තුන් සිතම පහදවා ඔබ පිදුව ඒ පෙමට

පිටුපාල මම ගියේ සංසාරෙ කළ පවට

පවසන්නෙ කෙලෙස මම

ඒ බවක් ඔය හදට

මුව වදන් ඇත ගොළුවෙලා...

******************************

## 17. කුළුඳුල් ප්‍රේමය

සිත් කොනක විළිලැව
කුළුඳුල් ම ප්‍රේමය
පුද දෙන්න සිතුනේ ම
නුඹෙ නමට සත්තමයි

දහසකුත් මල් වටා
කැරකෙමින් නට නටා
නුඹ යනෙන හැටි බලා
දුක් වුනා සත්තමයි

සුසුමකට ඉඩ දෙන්න
හද මඩල රිදවන්න
පෙමක් පුදනු ද කුමට
සිතුනි මට සත්තමයි

දැන දැනම නුඹේ හැටි
නුඹ ළඟම රැඳුනෙ මම
සංසාරෙ පුරුද්දක්
වෙන්න ඇති සත්තමයි

******************************

## 18. පුතුගෙ උරුමය

ගැබ්බර අහස

විළිලන්න සැරසෙයි

මුරුගසන් වැස්සක්

යමං පුත අගුපිළටවත්

වලව්වේ හාමුගේ.

වැස්සකටවත් ඉන්න

අවසරය ඉල්ලන්න

උප්පැන්න කඩදහියෙ

නම ගමක් නොලීවට.

*****************************

## 19. පිටමන් වෙන්න කොරෝනා

දුවනවා බස් රථය වේගයෙන්

නැවතුමක් නෑ ඉතින් වෙනද මෙන්

සුදු පාට මල් වගේ පොඩි එවුන්

හැංගිලා දෝ කොහේ කෙලෙසකින්

ඉවසන්නේ කොහොම මේ පාලු මන්

අනේ කොරෝනා හොඳ හිතින්

පිටමං වෙනවාද දැන් ඉතින්

******************************

## 20. කෙවිලියේ

කෙවිලියේ මගෙ මැණික
මම දන්නවා ඉතින්
නුඹ අසා ඉන්න බව
මගේ හඬ ඇහෙන තෙක්
මෙදා බක් මහේදිත්.

ඒත් මේ දුක කොහොම
කියන්නද මම නුඹට
කොරෝනා ඇවිල්ලලු
මෙදා අවුරුදු නැලු
නුඹට මට මේපාර
හමුවෙන්න තහනම්ලු

හිත හදාගෙන ඉතින්
එක්ව ඉමු හදවතින්
මැයි මාසයේ දිනක
ඇහෙනවා  මගේ හඬ සත්තකින්

*****************************

## 21. බොඳවූ සිහින

සිහින ගොඩක් හිතේ තියන්

නුඹේ ළඟින් මම හිටියා

සියලු සිහින බොඳ කරමින්

නුඹ වෙන අතකට හැරුණා

නුඹේ සිහින බොඳ කරමින්

ඈ වෙන අතකට ගියදා

මගේ සිහින ලෝකයටම

නැවතත් නුඹ ඇවිදිල්ලා

මගේ සිහින තුරුළු කරන්

සිත වෙන හදකට බැඳිලා

නුඹේ සිහිනයට ඉඩකඩ

නැත සිත තුළ ඉතිරි වෙලා

****************************

## 22. නැවතුමක් නැති ගෙත්තමක්

ලියන්නට අවැසියි ඔයා ගැන

හොඳම වදනක් හොඳම විදියට

එහෙත් නැත  නැගුනේ මසිතට

එකදු හෝ වදනක්

ඇරඹුමක් ඇති

නැවතුමක් නැති

අපේ  දිවි ගමනේ

මෙතෙක් ආ මග විවරණයකට

නොමැත මට වදනක්

තවම මම සිතමී

යලි යලිත් සිතමී

කල්පයක් හෝ සිතිය හැකි නම්

ඔබ ගැනම සිතමී

ඔබට ගැලපෙන හොඳම වචනය

තවම මම සිතමී

උපමේය නැති

උපමාද නැති

එකම එක වදනක්

තවම මම සිතමී

******************************

## 23. බලන් කඩතුරා හැර දෑසේ

දවසක වැඩත් ඇරගෙන

අත රැඳි සොච්චම ද වැය කර

දවසේම දෙවියන් යැද

සෞභාග්‍යයම ඉල්ලයි මිනිසුන්.

කිසිවක් නොඉල්ලා

දෙවොල පාමුල රැඳී සිට

බැතිමතුන් රැගෙන යන එන

ත්‍රීරෝද රථ රියදුරු

සවිබල ගැන්වී ද දෙවියන්

*****************************

## 24. නංගියේ මං අසරණයි

මට වඩා නුඹ ලස්සනත් ඇති

සුකුමාල බස් දොඩනවත් ඇති

ඒත් නංගියෙ නුඹේ ළඟ නැති

මගේ ආදරේ ඔහු දන්නේ නැති

සහතිකය ළඟ මමයි බලවත්

ආදරේ ළඟ නුඹයි බලවත්

එකම හදකට සෙනේ පිදුවත්

දෙන්නාම දුක උරුම බවලත්

යන්න හිතුනද බලා වෙනතක්

දරු සෙනේ ළඟ නොඒ අහිතක්

නුඹත් මේ ගැන සිතා මොහොතක්

යන්න හැකි වෙද පතා වෙනතක්

****************************

## 25. ආයි ආයි ආපි ඔන්න පාසල් කාලේ....

යාලුවෝ ටික දකින්නැතිව
ගුරු මව්පියො දකින්නැතිව
ඔන්ලයිනුත් යන්න බැරිව
ගත කළ ඒ නරක කාලේ
ඉවර වෙලා දැන් ......
මම ආසම ඇඳුම ඇඳන්
පොත් බෑගය කරේ දමන්
හනි හනිකට දුවන් ගියේ
පාසල වෙත මං ....
යාලුවෝ ටික ඇවිල්ල ඇති
මම එනකන් බලාන ඇති
දුව පනින්න හිනා වෙන්න
අත් අල්ලන් උඩ පනින්න
ආයි ආයි නැවත ඔන්න පාසල ඇරලා ...
පොදි බැඳගෙන පැතුම් මල්ල
ඇතුලු වුනේ පාසල වෙත
ලොකු සර්ගෙ කතා මල්ල
විසුනු කළා ඒ සියල්ල ...
පිට්ටනියට යන්න එපා

එක ළඟ ඉඳ ගන්න එපා

මීටරයක් දුරින් ඉන්න

ඇහුණා නේද ළමයි .....

මාස්ක් එකත් නොදා ඉන්න

දසන් විදා සිනා සෙන්න

එක බත් පත බෙදන් කන්න

පොත් ඉල්ලන් බලා ගන්න

අද සිට තහනම්

ඇහුණා නේද ළමයි ...

ඇහුණා සර් ...හොඳයි සර් ...

ඔයා තමයි මේ සේරම

නැති කෙරුවේ අනේ අපිට

අපේ පන්තියේ මුල්ලක

පාසලෙ කොහෙ හෝ අස්සක

ඔයා හැංගිලා ඇත්නම්

යන්නකො හනිකට ඉවතට

ආසම නෑ අපි ඔයාට

කො..රෝ..නා, කොරෝනා.

****************************

## 26. පාට කළ හීනයක්

ජීවිතේ පුරා තිබූ හීනයක්
ලස්සනට පාට කළ හීනයක්
සැබෑ කළා නුඹ ඇවිදින්
මා පැතූ මගේ  ලෝකයට

සඳුන් හරයක් අතේ තබනට
වත්කමක්  නොතිබුනත් ඒ දින
හදේ කැටිවුන සෙනේ රන් කිර
මුවේ තැබුවෙමි සෙනෙහසින්

පරතෙරක් නැති පැතුම් එකිනෙක
ගලා ආවේ උල්පතක් ලෙස
හදේ සෙනෙහස දෝර ගැලුවා
ඒ පැතුම් මල් වෙමින් විකසිත

රජෙක් වන්නට අවැසි නෑ නුඹ
බලෙන් අග තැන් පත් වෙලා
උතුම් මිනිසෙක් වෙයන් මා පුත
මිනිස් ගුණදම් සුරකිනා.....

******************************

## 27 අණ්ඩපාලී

සුදු ගවුමෙ ඉරුණු තැන්

අණ්ඩ දා මසා ගෙන

පාසලට මම ආවෙ

දෙපයෙ ගල් ඇනී ගෙන

ඒත් මගෙ දුක නොදැක

සමච්චල් සිනාවෙන්

අණ්ඩපාලී කියා

මට නමක් පට බැන්ද

මිතුර නුඹ ඉන්නවා

අදත් මගෙ හද කොනක

අල්ලකට සිඟාවත්

කන්න නැති වුනත් මට

අකුරු කෙරු නිසා මම

නුඹට වැඩියෙන් හොඳට

නගින්නට හැකි වුනා

විදු ලොවේ ඉහලකට

තරහවක් වෛරයක්

නැති වුනත් කිසි දිනක

මටත් නොදැනීම මගෙ

රිදුන හිත සොයනවා

නුඹ කොහේ කොතනකද

කියා අදටත් මිතුර

******************************

## 28. පොඩි කෙලී

අනේ ලොකු හාමු

වාවන්නෙ නෑ මගේ සිත

දුන්නාට පොඩි එකී

වලව්වේ මෙහෙවරට

රෙදි ටිකේ කුණු යන්න

හරියකට සෝදන්න

තවම මගේ පොඩි එකී

දන්නේ නම් නෑ හාමු

ඉදල පැත්තට ගෙවෙයි

අතුගාන විට මිදුල

සමාවෙන්න ලොකු හාමු

ඇට හුරු නෑ ඉදල

අතු ගෑවෙ ඉලපතෙන්

ඒත් හරි රටාවට

කුස්සියේ හැලි වළං

පොඩි වේවි ඈ අතින්

අනේ ලොකු හාමිනේ

අදින්න එපා සිහින් කෙහෙවල්ලෙන්

හෙමින් හුරු වෙයි වැඩට

ඈ තවම පොඩි එකී

පොඩි බේබිලා මිදුලේ

දුව පනින විටදි නම්

මගෙ කෙලිත් දුවයි ලොකු හාමිනේ

අනේ පොඩ්ඩක් තරහ අවසර

ඇළේ දොළේ දුව පැන්න

මතකේ තාමත් ඇති ඈට

******************************

## 29. බෙදුනු සෙනෙහස

නුඹේ ලෝකයෙ තවත් කෙනෙකුට

ඉඩක් ඇත්නම් ලැගුම් ගන්නට

බෙදුනු සෙනෙහේ අඩක් කුමටද

තනිකමට තනි රකින්නම්.........

සසර සැමදා ඔබේ වෙන්නට

පෙරුම් පිරුවද මෙතෙක් කල් මම

මිලානව ගිය ඒ පැතුම් මල

තුරුළු කරගෙන තිවෙන්නම්...........

*****************************

## 30. නුග ගසත් හැඬුවා

රණ්ඩු වෙවී යාළුවුන

යාළුවෙවී රණ්ඩු වුන

දඟකාර පෙම්වතුන්

කොතෙක් නම් සිටියාද

මේ මල් පාර දිගේ

මගේ සිසිලස විඳ විඳ

අනේ මට පාළුයි

කොහෙද උන් සැඟවුනේ

රුහුණ සරසවි බිමේ

කොරෝනා කඩ ඉමේ.

******************************

## 31. සීතලෙන් ගුලිවෙලා

සීතලෙන් ගුලිවෙලා උණුසුමක් සොයන විට

මැණියනි,පියාණනි

සිහිනෙන් පෙනුණා ඔබෙ රුව

කවදාවත්ම ඇන්දෙ නැති

ලස්සනම ලස්සන සළුපිළි

ඇඳන් සිටියා එසඳ ඔබ.......

සතුටුයි මට ඉතින්

කොහේ හෝ හොඳ තැනක

ඉපිද ඇති මට සිතෙයි

ඒ නිසයි ඔය තරම්

වටින කියන සළුපිළි ....

දන්නවා සංසාරේ කෙළවරක් නුදුටු බව

මොකද ඔබ දෙන්නාම

පෝදා ද කැප කළේ

සිල් රකින්නට නොවේ

අපි පහක් රකින්නට ....

ඒත් මට හිතෙනවා

ඒ පිනම ඇති ඔබට

සසර කෙටි කරන්නට

මතු නිවන් දකින්නට...

****************************

## 32. කැඩපතක සේයා

සඳවාගේ වටකුරුවට

මට පෙන් වූ මගේ මුහුණ

හංගන්නේ ඇයි අද නුඹ

තරහවෙලාදෝ

නිලට නිලේ දිලුණ වරල

එදා වගේ හැඩ නොකළේ

කැඩපත නුඹ මාත් එක්ක

තරහ වෙලාදෝ

මුතු කැට වැනි සුදු දත් පෙළ

තැනින් තැනින් කඩතොළු කර

පෙන්නන්නේ මාත් එක්ක

තරහ වෙලාදෝ

ඉඟ සුඟ ගත මිටින් ගන්න

හැඩ කර පෙන්වූ රූපය

තරබාරුව මවා පෑවෙ

කැඩපත නුඹ මාත් එක්ක

තරහ වෙලාදෝ

නව යෞවන අතීතයේ

මා ඉදිරියෙ මැවී රූපය

ආසාවට එක සැරයක්

පෙන්නන්නට බැරි තරමට

කැඩපත නුඹ මාත් එක්ක

තරහ වෙලාදෝ.....?

****************************

## 33. නිල්වලා රන් දිය

බෝතල් කළ ජලය

පාසලට ගෙන නොගිය

මා මෙන්ම  මිතුරු කැළ

දියට කට තියාගෙන

පවස සහ කුසගින්න

එකවරම  නිවාගත්

නිල්වලා රන් දියේ

ණය ගැතිය මම නුඹට

******************************

## 34. පියාණනි සදාදර

දිවි මගේ ගිමන්හල

හැඩ කළේ ඔබයි පියාණනි

දිවි පවස නිවාලූ

පැන් පොදත් ඔබයි පියාණනි

නේක දුක් උර මත දරා

ජීවන ගමනේ ජය ටැඹට

මා ඔසවා තැබූ

ඔබ මට මහ මෙරකි

කිසිදා බරක් නොවූ

*****************************

## 35. අසේවනාච බාලානං

අසේවනාච බාලානං

බුදුන් වහන්සේ දෙසුවා

ඇසුවේ නෑ කවුරුවත්ම

බාලයන් ම ඇසුරු කළා

පණ්ඩිතානංච සේවනා

බුදුන් වහන්සේ දෙසුවා

බාලයන්ම කර තියාන

පණ්ඩිතයන් මග හැරියා

ගහක් කොළක් නොමැති තැනක

තුත්තිරියත් ගහක් කියා

පණ්ඩිතයොත් බාල වෙලා

බාලයන්ට වැඳ වැටුනා

පූජාච පූජ නීයානං

බුදුන් වහන්සේ දෙසුවා

නොඇසූ කන් ඇතිව ඉඳන්

නොපිදිය යුත්තන් පිදුවා

එකින් එකට මගුල් කරුණු

ලෝකෙන් ගිලිහී වැටිලා

බාලයන්ගෙ බෙර පදයට

පණ්ඩිතයොත් දැන් නටනා.

******************************

## 36. එහෙන් මෙහෙන් ගෘහනියන්ගේ online කතා

ඔන්න ඔහෙ කියපුදෙන් ඕන දෙයක්

මට මොකද

ලොග් වෙලා නෙව ඉන්නෙ

මම නැතත් පෝන් එක......

කොයි තරම් වැඩද මට

මේ වගේ වෙලාවක

කාටවත් පෙනෙන් නැහැ

මේක මගෙ පවක්ම ද.........

කුස ගින්නෙ පොඩි එකා

වැටුන තැන නිදිය ගෙන

අප්පච්චි හිටියාට

බැහැනෙ උන් නලවන්න..........

දේශනය නම් හොඳයි

කොහොම අහගෙන ඉන්නෙ

මහත්තය හතර අත

කැරකෙනව බඩ ගින්නෙ ...........

මියුට් කරගෙන පෝන්

වීඩියොත් වසා ගෙන

කරනවා ගෙදර වැඩ

වෙන කුමක් කරන්නද.........

Dopamine වැඩිවෙන්න

හිත සතුට රජයන්න

මටත් ආසයි ඉතින්

පොඩ්ඩකට ඉඩදෙන්න.........

එහෙම නැත්නම් ඉතින්

හැමදාම වගෙ හෙටත්

ඇහුව වගෙ කියන්නම්

ඒක නියමයි කියල.

******************************

## 37. මට රිදෙන්නේ නෑ

ඔබ කෝටුපාර දුන්න කියල
මම අඬන්නේ නෑ
ඔය කෝටුපාර වැදුන කියල
මට රිදෙන්නෙ නෑ
ඔය කෝටුපාර අග්ගිස්සෙම
තැවරිල තියෙනා
ගුරු මව්පිය ආදරෙ මට
නොතේරෙන්නෙ නෑ
මම ගනන් හැදුවෙ නෑ
මම අකුරු ලිව්වෙ නෑ
වේවැල මට කියා දුන්නෙ
ඒව කරන්නයි
ඔබ කොච්චර බැන්නත්
ඔබ කොච්චර ගැහුවත්
මගෙ ගුරුතුමීට,ගුරුතුමාට
ගහ බනින්නෙ නෑ
ගෙදර ගිහින් ගතු කේලම්
මම කියන්නෙ නෑ
කෝටුපාර පිට හරහට වදින විට මගේ

ඔබෙ ඇස් අග කඳුලු බිඳුව

හිරවෙනු දුටුවේ

මට සමාවෙන්න මම ආයෙම

වැරදි කරන් නෑ

යන්න පාර කියල දෙන්න

වරද්ද ගන්නෑ

අම්ම තාත්තට වැඩියෙන්

ඔබෙ වෙනසක් නෑ

ඒ හින්දා මම ඔබගේ

හිත තලන්නෙ නෑ

මම අකුරු ලියන්නම්

මම ගනන් හදන්නම්

ඔබෙ හිත ළඟ හැමදාමත්

රැඳිලම ඉන්නම්

ලොව ජයගෙන

ගුරු දෙවිඳුනි

දෙපා වඳින්නම්.

******************************

## 38. ඔබම පමණය

එකමත් එක කාලෙක

එකමත් එක දවසක

එකමත් එක තැනක

එකමත් එක වෙලාවක

හමුවූ

එකමත් එක කෙනෙක් නොව

එකම කෙනෙක්

වේ නම් මේ ලොව

ඒ ඔබම ය

හමුවූ තැනම නැවතුණ

****************************

## 39. උල ලේනෝ නුඹ නාඬන්

ලෝකෙම බර කරේ තියන්

මනස විකාරෙන් පුරවන්

දිගු ගමනක රේස් දුවන

නොමිනිස් ගුණදම් වපුරණ

වල්මත් වූ මනුසත් කැළ

රෑ තිස්පැය සුසුම් හෙළති

උලලේනෝ නුඹ නාඬන්

නිවන්න බැරි උන්ගෙ දුකට...

අහිමි ආදරය සොයමින්

ඉකිළන හදවත් වෙනුවෙන්

එකින් එකට දුක අහමින්

රෑ තිස්සේ නිදිවරමින්

හැමදාමත් නුඹ අඬපන්

උන් සැනසේ නම්..........

ඒත් මගේ උලලේනෝ

යම් දවසක දුක වැඩි වී

හද ලෙංගතු දොරටු ඇරන්

හදවත පැලෙනා තරමට

මහ හයියෙන් නුඹ නාඩන්

නුඹේ කඳුළු ලේ බිඳු නම්

දකින්න බෑ උලලේනිට...........

******************************

## 40. තාත්තා සහ ස්ථාවර තැන්පතුව

කටට රසට රස මසවුළු

කන්නට හිත තිබුණත්

හිතට හොරා යාන්තමට

අඩකින් කුස රැළි ඇරගෙන

වහල අස්සෙන් පෙනෙන ආකාසේ

පැතුම් තාරකාවක් ළඟ හිත රඳවගෙන

ඒ තාරකාව ම ඉර හඳ කර ගන්න

තාත්තා ඇරඹුවා ස්ථාවර තැන්පතුවක්....

තැන්පතුව තර කරන්න

තාත්තා දරපු මහන්සිය

දෑතේ කරගැටවලින් නම්

මනින්නට බැරි තරම්...

කුඹුරු නැතත් කුඹුරු කොටල

හේන් නැතත් හේන් කොටල

ඉඩම් නැතත් ඉඩම් වවල

උපයාගත් හැම සතයම

බැර කෙරුවා තැන්පතුවට

කල්පිරෙන දිනයක් නොදැනම....

අවුරුදු ම විසි අටකට පස්සේ

පොලී සහිතව හොඳින් කල්පිරුණු

ස්ථාවර තැන්පතුව දැක

වැගුරුවා සතුටු කඳුළක්

හෙළා සැනසුම් සුසුමක්

මගේ... රත්තරන්.... තාත්තා....

****************************

## 41. හිතන්න, නවතින්න, ඉසිඹු ලන්න

හිමිදිරියෙ පාන්දර

නැගිටගත් වෙලේ සිට

පුටුවෙ ඉඳගෙන ඉඳන්

ඇඳේ පෙරලී ඉඳන්

යන්නෙ කොහෙදෝ නොදැන

ඔබ යමින් මොබ යමින්

අතට ගෙන ජංගමය

අනේ මන්දා සොයන තරමක්

රට වටේ ඇති කුණුම කුණු කඳු

මුලින් ඇමතුම රාජකාරිය

යන්නෙ ටිකකින් ඕපදූපය

නීල,වම්පා කමල රේඛා

පච් ඔයාලට පද හදපු එක

කතා කරලා ඉවර වෙන කොට

නැවතිලා නෙත මුහුණු පොත ළඟ

පෙළට එනවා මැසෙන්ජර් ටික

ලෝකේම නැති ආලවට්ටම්

මවා පාමින් තරඟයට මෙන්

ඉවරයක් නැති කතාබහ ටික

කීය වේවිද නතර වෙන කොට

හදා ගනිමුද පොඩි ඉඩක්වත්

අපිට අපි ගැන කතා කෙරුමට

කොරෝනා ඉඩ හදා දුන්නේ

විඩාවට ඉසිඹුවක් ගන්නට

*****************************

## 42. සඳට පෙම් බැඳි සිත්

හැඩට රුවට රැස් විහිදා

හා පැටියත් උකුළෙ තියා

නළවන විට හඳමාමේ

පුංචි අපිත් නැළවෙනවා

පුංචි කාලෙ පුංචි කමට

එහෙම කිව්ව මං..................

පෝයදාට හඳ එළියේ

ඔබෙ රූපය මට මැවුනේ

කවුලු දොරෙන් එන කිරණින්

ගත සිත සැලුනේ

සඳකුමරිය නුඹයි මගේ

පෙම්බර සිහිනේ

සඳඑළියෙන් උමතු වුනා

තරුණ කාලෙ මං..................

සොළොස් කලාවන් සපුරා

පුන්සඳ පායා එනවා

පසළොස්වක පෝය දිනය

ළඟයි දැනෙනවා

පරලොව සුගතිය ලබන්න

සසර ගමන කෙටි කරන්න

බෝමළුවේ සිසිලස ලැබ

අටසිල් දසසිල් පුරන්න

පෝය දවස හොඳම දවස

දැන් හිතනව මං.

*******************************

## 43. කණාමැදිරි එළි

හඳපාණෙ එළියෙන්

නුඹ එක්ක ආවෙ මම

හඳපානෙ තරම් නැති වුනත්

කණාමැදිරි එළියක් තරම්වත් ආලෝකයක්

මම නුඹෙන් පැතුව නිසා..........

දැනගෙන හිටියාට

කණාමැදිරි එළියට

තවෙකකුට නොව තමන්ටවත්

එළියක් වෙන්න නොහැකි බව

හඳ එළිය බබළන කොට

ගිනිකණ වැටුනාම

කණාමැදිරි එළිය අමතක වුනා මට........

සඳඑළිය පෙනි පෙනිම

කණාමැදිරි එළියට පෙම් බැඳි

මගෙ හීන ලෝකයට

හැමදාම අමාවක

****************************

## 44. දෙමව්පියෝ

හොඳම දේ දරුවන්ට කියලා
හැමදේම දරුවන්ට දීලා
සරුංගල් මෙන් උඩට ඇරලා
බලා ඉන්නා මව්පියෝ .............
කුසට අහරක් නැතත් රසවත්
ගතට සැරසිලි නැතත් කිසිවක්
ඉහල තලයට දරුවො ඔසවා
බලා ඉන්නා මව්පියෝ ...............
ගියත් අමතක ගියේ කොහොමද
ලැබූ ජය මුල හිටියෙ කවුරු ද
කිසිත් අමතක දරුවො දැක දැක
සෙනෙහෙ පුදනා මව්පියෝ ...........
සියලු සැප දෙවියන්ට පුදදෙන
ප්‍රසිද්ධියටම දන් පැනුත් දෙන
තමන් අමතක දරුකැළක් මැද
දුක් කඳුළු බොන මව්පියෝ .............

*****************************

## 45 මොටෝ රිය සහ අපි

සංචරණ සීමාවෙලා

නිවසටම කොටුවෙලා

අපි සැවොම වෙන්වෙලා

හිඳිමු තැන තැන බලා.......

ඒ කාලෙ අපි

ආ ගිය තැන්වල

මතක සැමරුම්

සුන්දර ද කොයිතරම් ........

ඔයාට මතකයි ද

හන්තාන නැංග හැටි

නුවර වැව ළඟ ඉඳන්

හඳට පෙම් බැන්ද හැටි

සීතල නුවරඑළියට

උනුසුමෙන් ගියපු හැටි

කිටිකිටියෙ හිරවෙලා

පොලොන්නරු ගිය දවස

රුමස්සල කන්ද ළඟ

රාස්සිගෙ අව්වත් එක්ක

මුහුදුරැළි ගැන්න දවස

හීනයක් තියෙනවා

ඔයත් එක්කම ගිහින්

කඳසුරිඳු වඳින්නට

ළඟදීම දවසකදි

ඔයාව සරසන්න

ලස්සන මල් මාලෙකුත්

අරන් එමු අපි එහෙන්

එතෙක් තව ඉවසන්න

*****************************

## 46. රොබරෝසියා

කවියන්ගෙ කවි සිතට

පෙම්වතුන්ගෙ පෙම් හිතට

මේ තරම් ලංවෙන්නෙ

කොහොම ද ඔයා

රොබරෝසියා ............

කාලෙකට ඇවිදිල්ලා

පරිසරය හැඩ කරලා

නොකියාම මැකිල යන

සුන්දරම දසුන ඔබ

රොබරෝසියා ................

විකසිත වෙලා ඉන්න

මගේ නෙත් මානයෙම

ආදරෙයි හැමදාම

රොබරෝසියා .

******************************

## 47. තුරු රජිඳා

ගතේ වෙලී දැවටී ආදරයෙන්

මගේ ළඟින් උන් මගෙ ආදර ලිය

ඇදලා සිඳලා වෙන් කර දමලා

මා බිම දැමුවේ කුරිරු ලෙසින්

කැලි කැලි කඳ වෙන් කරනා විට

කීතු කීතු ඉරුණා මගෙ හදවත

ඇත මැත ඉන්නා පැටවුන් ටික

තලා පෙලා දැමුවා නරුමයො ලෙස

එපා ළඳේ නුඹ වෛර කරන්නට

දිරි දී නැගිටවපන් පොඩිවුන් ටික

ආවොත් උන් අසරණ ලෙස දවසක

හුස්ම පොදක් දීපන් පිරිසිදුවට

මා නැති පාඩුව මකා දමන්නට

මගෙ පැටවුන් දැඩි වෙයි හති හතිකට

නැවතත් හදපන් ගං දිය ඇළි ටික

නරුම නොවෙමු අපි මිනිසුන් විලසට

****************************

## 48. පුත නුඹ වැරදි නැත

හීනියට ඉකි බිඳින
හොරෙන් කඳුලැල් සලන
නුඹ දිහා තවත් නම්
බලා ඉන්නද කොහොම....
වාරු නැති මගෙ දෙපා
ගෙයින් පිට ගනු බැරිව
කොහේවත් නොගිය මට
කොරෝනා හැදුවෙ නුඹ
කියා තව ඉකි බිඳිනු
එපා මගෙ රන් පුතේ
දරන්නේ මම කොහොම
මේ මගේ කරුමෙ නොවැ......
වැඩ පලට නුඹ ගියේ
යස ඉසුරු පතා නොව
රකිනු වස් මව පියා
සොච්චමක් සොයන්නට
කොරෝනා නුඹ ළඟට

ආව බව දැන දැනත්

වැඩ ගත්තෙ මහත්වරු

යස ඉසුරු පතා ගෙන

නුඹේ කරපිට මතින්

සුසානය වෙත යන්න

නෑසියන් පිරිවරා

එක් දිනක් හෝ ඉන්න

මටත් තිබුණා හිතක්

නැතුවාම නොවේ පුත

ඒත් මක් කොරන්න ද

මේ මගේ කරුමෙ නොවැ...

පෙට්ටියේ කොන් හතර

යන්තමින් එල්ල ගෙන

වැරදි කරුවෙක් වගේ

අරන් යන විට දි මම

දවුල් හොරණෑ හඬක්

හිතින් ඇහුණා මටත්

පන්සලේ ලොකු සමිඳු

මතක බණ දෙසනවා

වගේ කණ වැකී මම

නිවන් පැතුවා පුතේ

ඉතින් මගෙ රන් පුතේ

නවතපන් ඉකිබිඳුම

අම්මටත් පාලු ඇති

ඕනමයි නුඹෙ බැල්ම

කොයිතරම් දුක් වුනත්

නුඹේ අම්මත් මමත්

කැමති නෑ දකින්නට

නුඹේ ඇස්වල කඳුලු.

*****************************

## 49. පුතේ නුඹයි තනි අලියා අපේ සනුහරේ

වැඩිද පුතුනේ නුඹට මේ බර

පරපුරේ තනි අලිය වගෙ නුඹ

හතර වරිගෙම පැතුම් මළු පොදි

පටවලා ඇත නුඹේ කරපිට

නුඹ උපන් දා ආත්තම්මා

හතර අත දෙවියන්ට වැන්දා

පරපුරේ නාමය රකින්නට

දෙවියො දුන් කොලු පැටිය කියලා

කරවටක් දුක් ගොඩක ගිලිලා

ඉන්න පරපුර නිවා ලන්නට

නුඹේ දුක් කඳ නිවා ගන්නට

වේවි පුතුනේ නුඹට පළමුව

දකින විට උන් නුඹට ළංවෙයි

සොයා නෑකම් කිය කියා

ඉවත බලනට එපා පුතුනේ

සනුහරේ අතු ඉති නිසා

හුරු නැති බව ඇත්ත පුතේ

නුඹේ සමාජය ඔවුන්ට

ඇඳුම් කැඩුම් නොගැලපේවි

නුඹේ අයට හඳුනා දෙන්න

එහෙම උනත් පුතේ ඔවුන්

තරහක් නැති වේවි

නුඹේ වරුණෙ උජාරුවට

තැන තැන පවසාවී

පඩිපත අරගත්තු දාට

ණය ඇති බව ගෙවන්න

උන්ට කියල එපා පුතේ

අසරණ හිත් තලන්න

ණය වහගෙන නුඹේ රථය

අරන් ගියොත් ගමට

අගහිඟයක් නොදැනෙන්නට

පුරවල දෙයි ඩිකිය

රජෙක් වගේ නුඹ ඉන්නව

කියලා පෙන්වන්න

ඉඩ දීපන් ඒ ඇති පුත

උන්හට සැනසෙන්න

******************************

## 50. ගුරු දෙවියෝ

සක් දෙවිඳුනි උනු නොවේ ද
පඬුපුල් ආසනය ඔබේ
ලක් දීපේ ගුරු දෙවිවරු
අරගලයක පාරදිගේ

සරස්වතී දේවතාවි
උරණ වෙලා අහක බලල
ඇයට බැරිලු බැල්ම දෙන්න
ගුරු දෙවි කැළ පාරෙ හින්ද

ගණ දෙවි පිළිමෙත් දුක්වී
කඳුළු බින්දු වැහේ
නුවණ දෙන්න බැහැ කියනව
ගුරු දෙවිවරු වාගේ

තරාතිරම කුමක් වුවත්
දැරුවත් නෙක තනතුරු
ඒ හැමටම ඉහල ඉන්නෙ
මුල හදාපු ගුරුවරු

ඇතැමෙක් වියරුවෙන් වගේ
ලැවත් තව උඩුබුරූ
පහත් වෙන්නෙ නෑ කවදත්
අරටු වගේ ගුරු කඳු

යන යන තැන පැසසුම් ලැබූ
කෙනෙක් වෙතොත් ලෝකේ
ගුරුවරු මිස අන් කෙනෙකුන්
නැති බව නම් නිසැකේ

පාරක් පාරක් ගානේ
අයිතිය උදෙසා හඬගා
ගුරු සිත රිදුනොත් බැරිවෙයි
ශිල්ප දෙන්න තුටිනා

තිබූ තැනක සොර සතුරන්
ගත නොහෙනා ලෙසිනා
තැන්පත් කළ දැනුම් කන්ද
බලෙන් ගන්නෙ කොහොමා

මේ බව දැන පාලකයිනි

කල් මර මර නොඉඳ

මතු පරපුර රැක ගන්නට

විසඳනු මේ නඩුව

**අයිතීන් ඉල්ලා හඬ නගන ගුරුවරුන් වෙනුවෙනි**

*****************************